විමසුමට ලක්වන වසරේදී සංචාරක කර්මාන්තයේ උන්නතිය සඳහා සංචාරක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කඩිනම් අලෙවි වැඩපිළිවෙළ තවදුරටත් ගෙන යන ලදී. මේ සඳහා විදේශ වෙළෙඳපොළ පුළුල් කිරීමේ කටයුතු සඳහා ආසන්න වශයෙන් රුපියල් හාර කෝටි 90 ලක්ෂයක් වැය කරන ලදී. රජය විසින් ද සංචාරක කර්මාන්තය සඳහා පහසුකම් රාශියක් සළසා ඇත. මේවා අතර වාණිජ බැංකු හා වෙනත් දිගුකාලීන ණය දෙන ආයතන විසින් හෝටල් ව්‍යාපෘති සඳහා ප්‍රදානය කරන ලද ණය පහසුකම් නැවත උපලේඛණගත කිරීම හා සංචාරක කර්මාන්තයේ පසුබැම හේතුවෙන් හෝටල් කරුවන්ට මුහුණ පෑමට සිදුවී ඇති මූල්‍ය දුෂ්කරතාවයන්ට සහනයක් වශයෙන් පිරිවැටුම් බදු සියයට 10 සිට සියයට 5 දක්වා අඩු කිරීම ද ඇතුලත් වේ.

## ගෙවුම් තුලනය


ජංගම ගිණුමේ හිඟය විශාල වශයෙන් අඩුවීම නිසා 1984 තුළදී ගෙවුම් තුලන කටයුතුවල සැළකිය යුතු දියුණුවක් ඇති විය. වෙළෙඳ අනුපාතයේ ඇති වූ ඉමහත් වැඩි දියුණුව හා විදේශ පෞද්ගලික ප්‍රේෂණ තව දුරටත් ඉහළ යෑම ජංගම ගිණුමේ හිඟය මෙසේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1983 දී රුපියල් 1,112 කෝටි 20 ලක්ෂයක් (විගැහි 44 කෝටි 10 ලක්ෂයක්) වූ ජංගම ගිණුමේ හිඟය විමසුමට ලක්වන වසර තුළදී රුපියල් 78 කෝටි 90 ලක්ෂය (විගැහි දෙකෝටි 60 ලක්ෂය) දක්වා අඩු විය. 1984 වර්ෂය තුළදී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ද එවැනිම දියුණුවක් දක්නට ලැබිණි. විගැහි වටිනාකම අනුව අපනයන සියයට 45 ක වැඩිවීමක් වාර්තා කළ අතර, ආනයන වැඩිවූයේ සියයට 1.7 ක් වූ සුළු ප්‍රමාණයකිනි. ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1983 දී සියයට 9.1 සිට 1984 දී සියයට 0.5 දක්වා අඩු විය. නිළ සංක්‍රාම ඉවත් කළ පසු ජංගම ගිණුමේ හිඟය 1983 දී රුපියල් 1,513 කෝටි 80 ලක්ෂයේ (විගැහි 60 කෝටි 10 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 469 කෝටි 20 ලක්ෂය (විගැහි 17 කෝටි 60 ලක්ෂය) දක්වා අඩු වූ අතර, මෙම හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ වර්ෂ දෙක අතරතුර කාලයේ දී සියයට 12.4 සිට සියයට 3.1 දක්වා පහළ වැටිණි.

වෙළෙඳ භාණ්ඩ අපනයන වලින් 1983 දී රුපියල් 2,503 කෝටි 80 ලක්ෂයක් (විගැහි 99 කෝටි 30 ලක්ෂයක්) ලැබුණ අතර, අපනයන පරිමාව මෙන්ම මිළ ගණන් ද වැඩිවීම නිසා එම ලැබීම් 1984 දී රුපියල් 3,745 කෝටි 30 ලක්ෂය (විගැහි 143 කෝටි 90 ලක්ෂය) දක්වා වැඩි විය. තේ අපනයන ඉපැයීම් පමණක් රුපියල් 746 කෝටි 90 ලක්ෂයකින් (විගැහි 27 කෝටි 50 ලක්ෂයකින්) වැඩි විය. ප්‍රධාන අපනයන නිෂ්පාදන තුනෙන්ම ලත් අපනයන ඉපැයීම් වල එකතුව 1984 දී රුපියල් 806 කෝටි 20 ලක්ෂයකින් (විගැහි 29 කෝටි 10 ලක්ෂයකින්) වැඩි විය. ප්‍රධාන වශයෙන් රෙදි පිළි සහ මසා නිමකල ඇඳුම් හා අනිකුත් කාර්මික නිෂ්පාදන ඇතුළු සම්ප්‍රදායික නොවන අපනයන, සැළකිය යුතු ලෙස වැඩි වීම අපනයන අංශයේ ඇති වූ කැපී පෙනෙන ලක්ෂණය විය. සම්ප්‍රදායික නොවන නිෂ්පාදන වලින් ලත් අපනයන ඉපැයීම් 1984 දී සියයට 28 කින් ඉහළ ගියේය.

1983 දී රුපියල් 4,520 කෝටි 60 ලක්ෂයක් (විගැහි 179 කෝටි 40 ලක්ෂයක්) වූ භාණ්ඩ ආනයන වියදම 1984 දී රුපියල් 4,762 කෝටි 60 ලක්ෂයක් (විගැහි 182 කෝටි 50 ලක්ෂයක්) විය. ප්‍රධාන වශයෙන් සහල්, සීනි සහ කල් පවතින පාරිභෝගික භාණ්ඩ ඇතුළුව පාරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම 1984 දී පහත වැටුණි. ඒ අනුව මුළු ආනයන වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඛණිජ තෙල් නිෂ්පාදන හැර අනිකුත් අන්තර් භාණ්ඩ ආනයනය වැඩිවීමයි.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 35 සංඛ්‍යා සටහන

## 1980 – 1984 ගෙවුම් තුලනය—විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1980 | 1981(අ) | 1982(අ) | 1983(අ) | 1984(ආ) | 1980 | 1981(අ) | 1982(අ) | 1983(අ) | 1984(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. .. | – 16,312 | – 15,616 | – 20,403 | – 20,168 | – 10,173 | – 758 | – 693 | – 890 | – 801 | – 386 |
| අපනයන .. .. | 17,603 | 20,507 | 21,098 | 25,038 | 37,453 | 818 | 903 | 918 | 993 | 1,439 |
| ආනයන .. .. | 33,915 | 36,123 | 41,501 | 45,206 | 47,626 | 1,576 | 1,596 | 1,808 | 1,794 | 1,825 |
| 2. සේවා .. .. | + 859 | + 82 | – 314 | – 1,411 | – 1,558 | + 40 | + 4 | – 13 | – 56 | – 60 |
| ලැබීම් .. .. | 4,605 | 6,019 | 6,962 | 8,033 | 8,609 | 214 | 265 | 304 | 320 | 330 |
| ගෙවීම් .. .. | 3,746 | 5,937 | 7,276 | 9,444 | 10,167 | 174 | 261 | 317 | 376 | 390 |
| 3. භාණ්ඩ හා සේවා(1+2) .. | – 15,453 | – 15,534 | – 20,717 | – 21,579 | – 11,731 | – 718 | – 689 | – 903 | – 857 | – 446 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. .. | + 4,541 | + 7,036 | + 8,873 | +10,457 | +10,942 | + 211 | + 308 | + 387 | + 416 | + 420 |
| පෞද්ගලික (ශුද්ධ) .. .. | 2,260 | 3,918 | 5,494 | 6,441 | 7,039 | 105 | 172 | 240 | 256 | 270 |
| නිල (ශුද්ධ) .. .. | 2,281 | 3,118 | 3,379 | 4,016 | 3,903 | 106 | 136 | 147 | 160 | 150 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | – 10,912 | – 8,498 | – 11,844 | – 11,122 | – 789 | – 507 | – 381 | – 516 | – 441 | – 26 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. .. | + 6,585 | + 7,691 | +10,954 | +10,616 | + 8,561 | + 306 | + 341 | + 477 | + 420 | + 328 |
| පෞද්ගලික අංශය .. .. | 3,981 | 2,571 | 5,517 | 4,005 | 180 | 185 | 116 | 240 | 160 | 7 |
| රාජ්‍ය අංශය .. .. | 2,604 | 5,120 | 5,437 | 6,611 | 8,381 | 121 | 225 | 237 | 260 | 321 |
| දිගුකාලීන (ශුද්ධ) .. .. | 2,604 | 5,120 | 5,437 | 6,613 | 8,381 | 121 | 225 | 237 | 260 | 321 |
| ලැබීම් .. .. | (4,326) | (6,087) | (6,954) | (8,546) | (10,075) | (201) | (267) | (304) | (337) | (386) |
| ගෙවීම් .. .. | (1,722) | (967) | (1,517) | (1,933) | (1,694) | (80) | (42) | (67) | (77) | (65) |
| කෙටිකාලීන (ශුද්ධ) .. .. | — | — | — | – 2 | — | — | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | + 607 | – 39 | – 124 | + 82 | – 39 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | + 495 | + 188 | + 5 | + 766 | – 671 | + 23 | + 2 | + 21 | + 21·6 | – 5 |
| 9. විගැහි වෙන්කිරීම් .. .. | 258 | 252 | — | — | — | 12 | 12 | — | — | — |
| 10. සමස්ථ ශේෂය .. .. | – 2,967 | – 406 | – 1,009 | + 342 | + 7,062 | – 166 | – 26 | – 18 | + 0·6 | + 297 |
| 11. මූල්‍ය වෙනස්වීම් ( – අතිරික්තය) .. | + 2,967 | + 406 | + 1,009 | – 342 | – 7,062 | + 166 | + 26 | + 18 | – 0·6 | – 297 |
| ශ්‍රී ලංකා රුපියල්/විගැහි (විනිමය අනුපාතිකයේ සාමාන්‍යය) .. | | | | | | 21.52 | 22.67 | 22.98 | 25.16 | 26.08 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
සටහන: මූල්‍ය **අංශයේ සියළු** ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.36 සංඛ්‍යා සටහන
## සේවා සහ සංක්‍රාම 1983—1984

රුපියල් දශ ලක්ෂ (වරහන් තුල විගැහි දශ ලක්ෂ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1983 (අ) | 1984 (ආ) | වෙනස 1983 - 1984 | 1983 (අ) | 1984 (ආ) | වෙනස 1983 - 1984 | 1983 (අ) | 1984 (ආ) |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 1,617<br>(64) | 1,828<br>(70) | + 211<br>(+6) | 1,400<br>(55) | 1,459<br>(56) | + 59<br>(+1) | + 217<br>(+9) | + 369<br>(+14) |
| සංචාර .. | 2,404<br>(96) | 2,592<br>(99) | + 188<br>(+3) | 916<br>(36) | 1,214<br>(47) | + 298<br>(+11) | + 1,488<br>(+60) | + 1,378<br>(+52) |
| ආයෝජන ආදයම් .. | 1,056<br>(42) | 1,480<br>(57) | + 424<br>(+15) | 4,270<br>(171) | 4,836<br>(185) | + 566<br>(+14) | - 3,214<br>(-129) | - 3,356<br>(-128) |
| (1) ලාභ සහ ලාභාංශ .. | 4<br>(—) | 1<br>(—) | - 3<br>(—) | 255<br>(10) | 258<br>(10) | + 3<br>(—) | - 251<br>(-10) | - 257<br>(-10) |
| (2) පොළී .. | 1,052<br>(42) | 1,479<br>(57) | + 427<br>(+15) | 4,015<br>(161) | 4,578<br>(175) | + 563<br>(+14) | - 2,963<br>(-119) | - 3,099<br>(-118) |
| රජයේ වියදම් .. | 379<br>(15) | 302<br>(11) | - 77<br>(-4) | 270<br>(11) | 299<br>(11) | + 29<br>(—) | + 109<br>(+4) | + 3<br>(—) |
| විවිධ සේවා .. | 2,577<br>(103) | 2,407<br>(93) | - 170<br>(-10) | 2,588<br>(103) | 2,359<br>(91) | - 229<br>(-12) | - 11<br>(-) | - 48<br>(+2) |
| මුළු සේවා .. | 8,033<br>(320) | 8,609<br>(330) | + 576<br>(+10) | 9,444<br>(376) | 10,167<br>(390) | + 723<br>(+14) | - 1,411<br>(-56) | - 1,558<br>(-60) |
| පෞද්ගලික සංක්‍රාම .. | 6,916<br>(275) | 7,672<br>(294) | + 756<br>(+19) | 475<br>(19) | 633<br>(24) | + 158<br>(+5) | + 6,441<br>(+256) | + 7,039<br>(+270) |
| නිළ සංක්‍රාම .. | 4,016<br>(160) | 3,903<br>(150) | - 113<br>(-10) | —<br>(—) | —<br>(—) | —<br>(—) | + 4,016<br>(+160) | + 3,903<br>(+150) |
| මුළු සංක්‍රාම .. | 10,932<br>(435) | 11,575<br>(444) | + 643<br>(+9) | 475<br>(19) | 633<br>(24) | + 158<br>(+5) | + 10,457<br>(+416) | + 10,942<br>(+420) |
| මුළු සේවා සහ සංක්‍රාම .. | 18,965<br>(755) | 20,184<br>(774) | + 1,219<br>(+19) | 9,919<br>(395) | 10,800<br>(414) | + 881<br>(+19) | + 9,046<br>(+360) | + 9,384<br>(+360) |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1983 දී රුපියල් 141 කෝටි 10 ලක්ෂයක් (විගැහි පන්කෝටි 60 ලක්ෂයක්) වූ සේවා ගිණුමේ හිඟය 1984 දී රුපියල් 155 කෝටි 80 ලක්ෂය (විගැහි හයකෝටිය) දක්වා තව දුරටත් ඉහළ නැඟුණි. සංචාර සඳහා විදේශ විනිමය ගෙවීම් ඉහළ යාම මෙම හිඟය වැඩිවීමට ප්‍රධාන හේතුව විය. කෙසේ වෙතත් සංචාරක කර්මාන්තයෙන් ලත් දළ ඉපැයීම් රුපියල් 240 කෝටි 40 ලක්ෂයේ (විගැහි නවකෝටි 60 ලක්ෂයේ) සිට රුපියල් 259 කෝටි 20 ලක්ෂය (විගැහි නවකෝටි 90 ලක්ෂය) දක්වා 1984 දී සුළු වැඩිවීමක් පෙන්වීය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැරගැනුම් හා විදේශීය ණය සඳහා වූ පොළී ගෙවීම් තව දුරටත් සේවා ගිණුමේ විශාලතම හර අයිතමය හැටියට පැවතිණි. පොලී ගෙවීම් වශයෙන් ගලා ගිය විදේශ විනිමය ප්‍රමාණය 1983 දී රුපියල් 401 කෝටි 50 ලක්ෂයේ (විගැහි 16 කෝටි 10 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 457 කෝටි 80 ලක්ෂය (විගැහි 17 කෝටි 50 ලක්ෂය) දක්වා වැඩි වූ අතර, එම ප්‍රමාණය භාණ්ඩ හා සේවා අපනයනයන්ගෙන් ලත් මුළු ඉපැයීම් වලින් සියයට 10 ක් විය.

විදේශ වත්කම් ප්‍රමාණය 1984 දී ක්‍රමයෙන් ඉහළ නැගීම, ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන ඉහළ නැංවීමට සහ සේවා ගිණුමේ විශාල හිඟයක් ඇතිවීම වලක්වා ලීමට උපකාරී විය. විදේශ ආයෝජනවලින් ලත් පොළී ඉපැයීම් ප්‍රමාණය 1983 දී රුපියල් 105 කෝටි 20 ලක්ෂයේ (විගැහි හාරකෝටි 20 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 147 කෝටි 90 ලක්ෂය (විගැහි පන්කෝටි 70 ලක්ෂය) දක්වා වැඩි විය. ඒ අනුව පොළී ගණුදෙනු සම්බන්ධයෙන් විදේශ විනිමය ශුද්ධ ගලායාම විගැහි වටිනාකම අනුව බොහෝ දුරට පසුගිය වසරේ පැවති මට්ටමේම (උදා : විගැහි 11 කෝටි 80 ලක්ෂය) පවත්වා ගැනීමට හැකි විය. එබැවින්, ' ආයෝජන ආදායම් ' අංශයේ ශුද්ධ ගලායාම නිරපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතියත් ඒ මගින් ගෙවුම් තුලනය මත ඇති වූ පීඩනය 1983 පැවති ප්‍රමාණයට වඩා දැඩි නොවීය.

1983 දී රුපියල් 31 කෝටි 50 ලක්ෂයක් (විගැහි එක්කෝටි 30 ලක්ෂයක්) වූ වරාය, ප්‍රවාහනය, රක්ෂණ, රජයේ වියදම් හා අනිකුත් විවිධ සේවාවන්ගෙන් ලැබූ ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය 1984 දී රුපියල් 42 කෝටියක් (විගැහි එක්කෝටි 60 ලක්ෂයක්) විය.

ප්‍රධාන වශයෙන් එතෙර සේවය කරන්නන්ගේ ප්‍රේෂණවලින් සමන්විත වන පෞද්ගලික සංක්‍රාමවල දළ ලැබීම් විගැහි වටිනාකම අනුව සියයට 7 කින් වැඩි වී රුපියල් 767 කෝටි 20 ලක්ෂයක් (විගැහි 29 කෝටි 40 ලක්ෂයක් ) විය. කෙසේ නමුත් ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ලැබීම් වැඩිවූයේ සියයට 5 කින් වන අතර, එම ප්‍රමාණය රුපියල් 703 කෝටි 90 ලක්ෂයක් (විගැහි 27 කෝටියක්) විය. මෙයට හේතුව, 1983 හා සසඳන විට 1984 දී පිටතට ගලා ගිය සංක්‍රාම අධික වීමය. 1970 ගණන්වල ප්‍රථම භාගයේ දී එතරම් වැදගත් නොවූ පෞද්ගලික සංක්‍රාම දැන් සමස්ත ගෙවුම් තුලන කටයුතු වලදී ඉතා වැදගත් සාධකයක් බවට පත්වී ඇත.

යෝජනා ක්‍රම ප්‍රදාන හා ආහාර සහ ද්‍රව්‍ය ප්‍රදානවලින් සමන්විත වන නිල සංක්‍රාම මෙම වර්ෂය තුළදී රුපියල් 401 කෝටි 60 ලක්ෂයේ (විගැහි 16 කෝටියේ) සිට රුපියල් 390 කෝටි 30 ලක්ෂය (විගැහි 15 කෝටිය) දක්වා අඩු විය. කෙසේ වුවත්, 1983 දී විශේෂ හදිසි සහනාධාර ස්වරූපයෙන් ලැබුණ රුපියල් 28 කෝටි 80 ලක්ෂයක් (විගැහි එක් කෝටි 10 ලක්ෂයක්) ද මෙම ප්‍රමාණයට ඇතුළත් කොට ඇත. මුළු නිල ප්‍රදාන වලින්, යෝජනා ක්‍රම ප්‍රදාන වශයෙන් ලැබුණ කොටස 1983 දී සියයට 58 සිට 1984 දී සියයට 60 දක්වා වැඩි විය.

පෞද්ගලික හා නිල සංක්‍රාම යන අංශ දෙකින්ම ලැබුණ ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය මෙම වර්ෂ දෙක තුළ දී රුපියල් 1,045 කෝටි 70 ලක්ෂයේ (විගැහි 41 කෝටි 60 ලක්ෂයේ) සිට රුපියල් 1,094 කෝටි 20 ලක්ෂය (විගැහි 42 කෝටිය) දක්වා වැඩි වූ අතර, එය භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟය වන රුපියල් 1,173 කෝටි 10 ලක්ෂයෙන් (විගැහි 44 කෝටි 60

ලක්ෂයෙන් සියයට 95 ක් පමණ පියවා ගැනීමට ප්‍රමාණවත් විය. මේ නිසා මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් මගින් මූල්‍යකරණය කිරීම සඳහා ඉතිරිව තිබුනේ ජංගම ගිණුමේ හිඟයෙන් රුපියල් 78 කෝටි 90 ලක්ෂයක (විගැහි දෙකෝටි 60 ලක්ෂයක) ප්‍රමාණයක් පමණි. කෙසේ වෙතත්, සෘජු ආයෝජන, පෞද්ගලික සහ කෙටි කාලීන ප්‍රාග්ධන ගලාඒම් ඇතුළුව රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන ලැබීම් වලින් සමන්විත මූල්‍ය නොවන ප්‍රාග්ධනයේ ශුද්ධ ලැබීම්, පියවීමට තිබූ ශේෂයට වඩා ඉතා අධික විය. මෙහි ශුද්ධ ප්‍රතිඵලය වූයේ 1984 ගෙවුම් තුලනයේ විගැහි 29 කෝටි 70 ලක්ෂයක වාර්තාගත සමස්ත අතිරික්තයක් ඇතිවීමය.

1 . 37 සංඛ්‍යා සටහන

**1982 – 1984 විදේශ සම්පත් පරතරය පියවීම**

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | (අ) 1982 | (ආ) 1983 | (ආ) 1984 | (අ) 1982 | (අ) 1982 | (ආ) 1984 |
| **1. විදේශීය ඉපැයීම** .. | **34,084** | **39,987** | **53,734** | **1,485** | **1,588** | **2,063** |
| 1.1 අපනයන .. | 21,098 | 25,038 | 37,453 | 918 | 993 | 1,439 |
| 1.2 සේවා .. | 6,962 | 8,033 | 8,609 | 304 | 320 | 330 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 6,024 | 6,916 | 7,672 | 263 | 275 | 294 |
| **2. විදේශීය ගෙවීම** .. | **63,382** | **72,937** | **75,694** | **2,763** | **2,905** | **2,901** |
| 2.1 ආනයන .. | 41,501 | 45,206 | 47,626 | 1,808 | 1,794 | 1,825 |
| 2.2 සේවා .. | 7,276 | 9,444 | 10,167 | 317 | 376 | 390 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 530 | 475 | 633 | 23 | 19 | 24 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම .. | 14,075 | 17,812 | 17,268 | 615 | 716 | 662 |
| **3. විදේශ සම්පත් පරතරය** .. | **– 29,298** | **– 32,950** | **– 21,960** | **– 1,278** | **– 1,317** | **– 838** |
| **4. සම්පත් පරතරය පියවීම** .. | **+ 29,298** | **+ 32,950** | **+ 21,960** | **+1,278** | **+1,317** | **+ 838** |
| 4.1 ණය තත්ත්වය කෙරෙහි බල නොපාන ගණුදෙනු තුලින් පියවීම .. | 4,756 | 4,945 | 4,837 | 207 | 197 | 186 |
| 4.1.1 නිල ප්‍රදාන .. | 3,379 | 4,016 | 3,903 | 147 | 160 | 150 |
| 4.1.2 සෘජු ආයෝජන .. | 1,377 | 929 | 934 | 60 | 37 | 36 |
| 4.1.3 විගැහි වෙන්කිරීම .. | — | — | — | — | — | — |
| 4.2 ණය ලබාගැනීම් සහ සංචිත උපයෝගිකර ගැනීම .. | 24,661 | 27,157 | 17,833 | 1,050 | 1,099 | 657 |
| 4.2.1 දිගු කාලීන ණය .. | 5,987 | 7,330 | 9,098 | 262 | 290 | 349 |
| 4.2.2 කෙටි කාලීන ණය .. | 10,504 | 14,370 | 11,066 | 458 | 571 | 423 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය සහ අනිකුත් දිගුකාලීන ණය .. | 4,307 | 2,087 | 977 | 188 | 81 | 38 |
| 4.2.4 වාණිජ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 1,702 | 2,259 | 1,034 | 74 | 90 | 40 |
| 4.2.5 බැංකු ණය ගැනීම් .. | 1,595 | 30 | — | 68 | — | — |
| 4.2.6 ද්විපාර්ශ්වික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 විගැහි හැර ගැනීම් .. | 1,506 | 6,622 | 1,288 | 45 | 47 | 31 |
| 4.2.8 වෙනත් .. | 1,071 | 1,252 | 285 | 46 | 41 | 13 |
| 4.2.9 සංචිත .. | – 2,011 | – 1,793 | – 5,915 | – 91 | – 21 | – 237 |
| **5. රුපියල් අගය පිළිබඳ ගැලපිලි** .. | **– 124** | **+ 82** | **– 39** | — | — | — |
| **6. වැරදීම් හා අත්හැරීම්** .. | **+ 5** | **+ 766** | **– 671** | **+ 21** | **+ 21** | **– 5** |

**(අ) සංශෝධිත.**
**(ආ) තාවකාලික.**

**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.**

රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකටම 1984 දී ගලා ආ ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධනය රුපියල් 856 කෝටි 10 ලක්ෂයක් (විගැහි 32 කෝටි 80 ලක්ෂයක්) වූ අතර, එය පසුගිය වසරේ ප්‍රමාණය වන රුපියල් 1,061 කෝටි 60 ලක්ෂයට (විගැහි 42 කෝටියට) වඩා සියයට 22 ක අඩුවීමකි. පසුගිය වසරේ මෙන්ම 1984 දී ද මෙම අඩුවීමට හේතුව සෘජු ආයෝජනයන් නොවන

පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ලැබීම් පහත වැටීමයි. 1984 දී රුපියල් 18 කෝටියකට (විගැහි 70 ලක්ෂයකට) ඇස්තමේන්තු කොට ඇති පෞද්ගලික අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම 1983 දී රුපියල් 400 කෝටි 50 ලක්ෂයක (විගැහි 16 කෝටියක) ප්‍රමාණය සමඟ සැසඳිය හැක. කෙසේ නමුත්, රාජ්‍ය අංශයට ගලා ආ මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධනය මෙම වර්ෂ දෙක අතරතුරදී රුපියල් 661 කෝටි 10 ලක්ෂයේ (විගැහි 26 කෝටියේ) සිට රුපියල් 838 කෝටි 10 ලක්ෂය විගැහි 32 කෝටි 10 ලක්ෂය) දක්වා වැඩි විය.

මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ හා විදේශ ආයෝජන උපදේශක කමිටුව යටතේ ඇති ව්‍යාපෘතීන්හි 1984 දී කළ සෘජු ආයෝජන ප්‍රමාණය රුපියල් 91 කෝටි 20 ලක්ෂයක් (විගැහි තුන්කෝටි 50 ලක්ෂයක්) විය. විගැහි වටිනාකම අනුව බලන කල මෙරටට ගලා ආ විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය බොහෝ දුරට පසුගිය වසරේ ප්‍රමාණයට සමාන විය. කෙසේ වෙතත් ප්‍රාග්ධන ණය ස්වරූපයෙන් පෞද්ගලික අංශයට ලැබුණු මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ප්‍රමාණයේ සැළකිය යුතු පහත වැටීමක් ඇති විය. මෙම පහත වැටීම කෙටිකාලීන මෙන්ම දිගුකාලීන ප්‍රාග්ධන ලැබීම් යන දෙඅංශයෙන්ම දක්නට ලැබිණ. එයාර් ලංකා සමාගමට ගලා ආ දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධනය 1983 දී රුපියල් 48 කෝටියක් (විගැහි එක්කෝටි 90 ලක්ෂයක්) වූ අතර, 1984 දී රුපියල් 15 කෝටි 40 ලක්ෂයක් (විගැහි 60 ලක්ෂයක්) විය. අනිකුත් පෞද්ගලික දිගුකාලීන ණය ස්වරූපයෙන් ලැබුන ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධනය ද, ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් ලබාගත් දළ විදේශීය ණය ප්‍රමාණය අඩුවීම නිසා රුපියල් 197 කෝටි 50 ලක්ෂයකින් (විගැහි හත්කෝටි 70 ලක්ෂයකින්) අඩු විය. කෙටිකාලීන මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් 1984 දී රුපියල් 154 කෝටි 80 ලක්ෂයකින් (විගැහි හයකෝටි 30 ලක්ෂයකින්) අඩු විය. මෙම අඩුවීම, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවා ඇති ප්‍රතිග්‍රහණ ණය ප්‍රමාණය පහළ වැටීමේ සෘජු ප්‍රතිඵලයකි. කෙටි කාලීන වෙළෙඳ ණය ගැනීම් 1984දී රුපියල් 18 කෝටි 70 ලක්ෂයකින් (විගැහි 70 ලක්ෂයකින්) අඩු විය.

යෝජනා ක්‍රම ණය හා ද්‍රව්‍ය ණය වැඩි වශයෙන් මුදා හැරීම නිසා රාජ්‍ය අංශයට ගලා ආ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය වැඩි විය. යෝජනා ක්‍රම වෙනුවෙන් 1983 දී මුදා හරිනු ලැබූ දළ ණය ප්‍රමාණය රුපියල් 538 කෝටි 40 ලක්ෂයක් (විගැහි 21 කෝටි 30 ලක්ෂයක්) වූ අතර, 1984 දී එම ප්‍රමාණය රුපියල් 665 කෝටියක් (විගැහි 25 කෝටි 50 ලක්ෂයක්) විය. ආහාර හා ද්‍රව්‍ය ණය වෙනුවෙන් මුදා හරිනු ලැබූ ප්‍රමාණය මෙම වර්ෂ දෙක තුළදී රුපියල් 133 කෝටි 80 ලක්ෂයේ (විගැහි පන්කෝටි 30 ලක්ෂයේ) සිට රුපියල් 156 කෝටි 80 ලක්ෂය (විගැහි හය කෝටිය) දක්වා වැඩි විය. මීට අමතරව සාමූහික යුරෝ ව්‍යවහාර මුදල් ණයෙන් ලබා නොගෙන තිබූ ඇ.එ.ජ. ඩොලර් තුන්කෝටි 50 ලක්ෂයක (රුපියල් 88 කෝටියක-විගැහි තුන්කෝටි 40 ලක්ෂයක) ප්‍රමාණය ද 1984 දී ලබා ගන්නා ලදී. තවද, දැනට ක්‍රියාත්මකව පවත්නා සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් 97 කෝටි 70 ලක්ෂයක (විගැහි තුන්කෝටි 70 ලක්ෂයක) වාණිජ ණය ලබා ගත් අතර, 1983 දී එවැනි ණය රුපියල් 121 කෝටි 70 ලක්ෂයක් (විගැහි හාරකෝටි 70 ලක්ෂයක්) ලබාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය අංශය සඳහා මූල්‍ය නොවන ප්‍රාග්ධනයේ මුළු දළ ලැබීම් 1983 දී රුපියල් 854 කෝටි 60 ලක්ෂයේ (විගැහි 33 කෝටි 70 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 1,007 කෝටි 50 ලක්ෂය (විගැහි 38 කෝටි 60 ලක්ෂය) දක්වා වැඩි විය. මූල්‍ය තත්ත්වය වර්ධනය වීම නිසා, දැනට ලබාගෙන ඇති යුරෝ ව්‍යවහාර මුදල් ණයෙහි සම්පූර්ණ ප්‍රතිලාභ ප්‍රමාණයම නැවත ආයෝජනය කිරීමට රජය තීරණය කරන ලදී. විදේශ ණය ආපසු ගෙවීම් 1984 දී රුපියල් 169 කෝටි 40 ලක්ෂයක් (විගැහි හයකෝටි 50 ලක්ෂයක්) වූ අතර, පසුගිය වසරේ එය රුපියල් 193 කෝටි 30 ලක්ෂයක් (විගැහි හත්කෝටි 70 ලක්ෂයක්) විය. ක්‍රියාත්මක ව පවත්නා සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ අත්තිකාරම් ගෙවීම් ද 1983 වටිනාකමට ඇතුළත් කොට ඇත.

**විදේශ වත්කම්**

ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය විගැහි වටිනාකම අනුව සියයට 47 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1983 දී රුපියල් 1,302 කෝටි 60 ලක්ෂයේ (විගැහි 49 කෝටි 90 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 1,894 කෝටි 20 ලක්ෂය(විගැහි 73 කෝටි 50 ලක්ෂය) දක්වා වර්ධනය විය. ගෙවුම් තුලනයේ ඇතිවූ සතුටුදායක සමස්ත ශේෂය පිළිබිඹු කරමින් ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය ද 1984 දී සැළකිය යුතු ලෙස වර්ධනය වී වසර අවසානය වන විට රුපියල් 712 කෝටි 80 ලක්ෂයක් (විගැහි 28 කෝටි 40 ලක්ෂයක්) ව පැවතින.

රජයේ සහ මහ බැංකුවේ දළ විදේශ වත්කම් වලින් සමන්විත වන දළ නිල සංචිත ප්‍රමාණය 1983 දී රුපියල් 790 කෝටි 10 ලක්ෂයක් (විගැහි 30 කෝටි 30 ලක්ෂයක්) වූ අතර, 1984 අවසානය වන විට රුපියල් 1,372 කෝටි 40 ලක්ෂයක් (විගැහි 53 කෝටි 30 ලක්ෂයක්) විය. 1984 වර්ෂය තුළ දළ නිළ සංචිතවල සියයට 76 ක වැඩිවීමක් මෙයින් පෙන්නුම් කෙරේ. මහ බැංකුවේ විදේශ ද්‍රවශීල ශේෂයන් සහ විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් වැඩිවීම හා රජය විසින්, යුරෝ-ව්‍යවහාර මුදල් ණය ආයෝජනය කිරීම, මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වාණිජ බැංකු සතු දළ විදේශ වත්කම් ප්‍රමාණය 1983 දී රුපියල් 512 කෝටි 50 ලක්ෂයක් (විගැහි 19 කෝටි 60 ලක්ෂයක්) වූ අතර, 1984 දී එය රුපියල් 521 කෝටි 80 ලක්ෂයක් (විගැහි 20 කෝටි 20 ලක්ෂයක්) දක්වා සුළු වශයෙන් වැඩි විය. 1984 අවසාන වන විට පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය 1985 සඳහා ඇස්තමේන්තු කොට ඇති ආනයන වලින් මාස හතරහමාරක අවශ්‍යතාවයන් පියවාගැනීමට ප්‍රමාණවත් විය.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට හැර අනිකුත් සියළුම ප්‍රධාන ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව 1984 දී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම වැඩි විය. ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 4.9 කින් රුපියලේ වටිනාකම අඩු වූ නමුත්, එක්සත් රාජධානියේ පවුමට ප්‍රතිමුඛව සියයට 17.6 කින් ද ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 11.0 කින් ද ඩොයිෂ් මාර්ක් හා ප්‍රංශ ප්‍රෑන්ක් යන මුදල් වලට ප්‍රතිමුඛව සියයට 9.0 බැගින්ද ජපන් යෙන් මුදලට ප්‍රතිමුඛව සියයට 2.0 කින් ද වටිනාකම වැඩි විය. 1977 නොවැම්බර් 16 වන දින සිට ඇතිවූ සමුච්චිත වෙනස්කම්වලට අනුව රුපියලේ විදේශ වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 39.1 කින් ද ජපන් යෙන් මුදලට ප්‍රතිමුඛව 37.8 කින් ද ඩොයිෂ් මාර්ක් මුදලට ප්‍රතිමුඛව සියයට 14.9 කින් ද ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 12.6 කින් ද එක්සත් රාජධානියේ පවුමට ප්‍රතිමුඛව සියයට 4.8 කින් ද අඩුවී ඇති අතර, ප්‍රංශ ප්‍රෑන්ක් මුදලට ප්‍රතිමුඛව සියයට 20.5 කින් වැඩි වී ඇත. 1984 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම විගැහි වලට ප්‍රතිමුඛව ද සියයට 1.2 කින් වැඩි වූ අතර 1977 නොවැම්බර් 16 වැනි දින සිට විගැහි වලට ප්‍රතිමුඛව ඇති වූ සමස්ත පිරිහීම 1984 අවසානය වන විට සියයට 26.8 කට සීමා විය.

**1 . 38 සංඛ්‍යා සටහන**

**1982 – 1984 විනිමය අනුපාතික (අ)**


| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (එකක් රුපියල්) | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම් (ආ) | |
|---|---|---|---|---|---|
| | 1982 | 1983 | 1984 | 1983 | 1984 |
| විශේෂ ගැනුම් හිමිකම් .. | 23·5569 | 26·1260 | 25·8065 | 9·83 | (1·24) |
| ඇ. එ. ජ. ඩොලර් .. | 21·3200 | 25·0000 | 26·2800 | 14·72 | 4·87 |
| එ. රා. ස්ටර්ලින් පවුම් .. | 34·6130 | 35·8938 | 30·5111 | 3·57 | (17·64) |
| ඩොයිෂ් මාර්ක් .. | 8·9806 | 9·1050 | 8·3495 | 1·37 | 9·05 |
| ජපන් යෙන් .. | 0·09123 | 0·10712 | 0·10497 | 14·83 | (2·05) |
| ප්‍රංශ ප්‍රෑන්ක් .. | 3·1726 | 2·9744 | 2·7276 | (6·66) | (9·05) |
| ඉන්දියානු රුපියල් .. | 2·1597 | 2·3531 | 2·1192 | 8·22 | (11·04) |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වරහන් තුල ඇති සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියලෙහි අගය වැඩිවීම පෙන්නුම් කරයි.
(ආ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.

# විදේශ වත්කම්


ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

# විනිමය අනුපාතික

**1977 නොවැම්බර් 16 වැනි දින සිට සමුච්චිත ප්‍රතිශත වෙනස්වීම්**




ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : **1977 වර්ෂය සඳහා අනුපාතික වෙනස්වීම් පෙන්වා ඇත්තේ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහාය. සෙසු වර්ෂවල මෙම වෙනස්වීම් දක්වා ඇත්තේ කාර්තුගත පදනමක් මතය.**

**විදේශ ණය**

සියලුම දිගු කාලීන, මැදි කාලීන හා කෙටි කාලීන ණයවලින් සමන්විත වන, නොගෙවා ඉතිරිව ඇති ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය 1983 අවසානයේදී තිබූ රුපියල් 6,795 කෝටි 20 ලක්ෂයේ (විගැහි 260 කෝටි 60 ලක්ෂයේ) සිට 1984 අවසානය වන විට රුපියල් 7,432 කෝටි 10 ලක්ෂය (විගැහි 288 කෝටි 10 ලක්ෂය) දක්වා වැඩි විය. නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය විගැහි වටිනාකම අනුව සියයට 10.5 කින් ඉහළ ගිය නමුත් එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් හැටියට ගතහොත් මෙම වර්ෂ දෙක අතර කාලය තුළදී සියයට 55.9 සිට සියයට 49.0 දක්වා පහත වැටිණ.

සැපයුම් කරුවන්ගේ ණය ඇතුළුව රජයේ දිගු කාලීන හා මැදි කාලීන ණය 1983 දී රුපියල් 4,672 කෝටි 90 ලක්ෂයේ (විගැහි 178 කෝටි 50 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 5,419 කෝටි 20 ලක්ෂය (විගැහි 210 කෝටි 40 ලක්ෂය) දක්වා වැඩි විය. ණය මූලාශ්‍ර අනුව වර්ග කිරීමේදී නොගෙවා ඉතිරිව ඇති රජයේ බහු පාර්ශ්වීය ණය රුපියල් 330 කෝටි 10 ලක්ෂයකින් (විගැහි 13 කෝටි 60 ලක්ෂයකින්) වැඩි වී ඇති අතර ද්විපාර්ශ්වීය ණය හා මූල්‍ය වෙළෙඳපොල වලින් ලබා ගත් ණය පිළිවෙලින් රුපියල් 285 කෝටි 80 ලක්ෂයකින් (විගැහි 12 කෝටි 80 ලක්ෂයකින්) හා රුපියල් 149 කෝටි 70 ලක්ෂයකින් (විගැහි හයකෝටි 20 ලක්ෂයකින්) වැඩිවී ඇත. නොගෙවා ඉතිරිව ඇති රජයේ මුළු විදේශ ණය වලින් සියයට 48 ක් යෝජනා ක්‍රම ණය වන අතර යෝජනා ක්‍රම නොවන ණය ප්‍රමාණය සියයට 52 කි. රාජ්‍ය සංස්ථාවල නොගෙවා ඉතිරිව ඇති මුළු විදේශ ණය ප්‍රමාණය මෙම වර්ෂ දෙක තුළදී රුපියල් 902 කෝටි 70 ලක්ෂයේ (විගැහි 34 කෝටි 50 ලක්ෂයේ) සිට රුපියල් 918 කෝටි 10 ලක්ෂය (විගැහි 35 කෝටි 60 ලක්ෂය) දක්වා වැඩි විය. 1984 අවසානය වන විට රජය විසින් ඇප සහිත කළ පෞද්ගලික අංශයේ ණය ප්‍රමාණය රුපියල් නව කෝටි 80 ලක්ෂයක් (විගැහි 40 ලක්ෂයක්) වූ අතර රජය ඇප නොවූ ණය ප්‍රමාණය රුපියල් 117 කෝටි 80 ලක්ෂයක් (විගැහි හාර කෝටි 60 ලක්ෂයක්) විය.

**1 . 39 සංඛ්‍යා සටහන**

**1983 – 1984(ආ) නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය**

**(මුදහරින ලද)**

| ශීර්ෂ | රුපියල් දශ ලක්ෂ | | විගැහි දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 1983 | 1984 | 1983 | 1984 |
| I. දිගු හා මධ්‍ය කාලීන | 56,891·5 | 64,649·4 | 2,173·6 | 2,509·6 |
| 1. රජය .. | 46,729·4 | 54,191·8 | 1,785·3 | 2,103·7 |
| 2. රජය ඇපවූ රාජ්‍ය සංස්ථා .. | 9,027·3 | 9,181·3 | 344·9 | 356·4 |
| 3. රජය ඇපවූ පෞද්ගලික අංශය .. | 77·8 | 98·0 | 3·0 | 3·9 |
| 4. රජය ඇප නොවූ රාජ්‍ය සංස්ථා .. | — | — | — | — |
| 5. රජය ඇප නොවූ පෞද්ගලික අංශය .. | 1,057·0 | 1,178·3 | 40·4 | 45·6 |
| II. කෙටි කාලීන සහ වෙනත් .. | 11,060·5 | 9,671·1 | 432·5 | 371·2 |
| 1. ජා.මු.අ. හැර ගැනීම් .. | 4,870·3 | 5,050·0 | 196·0 | 191·8 |
| 2. බැංකු ණය ගැනීම් .. | 1,873·1 | 12·7 | 71·6 | 0·5 |
| 3. වෙනත් (ආ) .. | 4,317·1 | 4,608·4 | 164·9 | 178·9 |
| නොගෙවා ඉතිරිව ඇති ණය එකතුව (I+II) .. | 67,952·0 | 74,320·5 | 2,606·1 | 2,880·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික

(ආ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ ම. කො. ආ. කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබා ගත් ණයද ඇතුලත්වේ.

1 . 40 සංඛ්‍යා සටහන

1980 - 1984 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැයි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1980 | 1981 | 1982 | 1983 | 1984 (අ) | 1980 | 1981 | 1982 | 1983 | 1984 (අ) |
| 1. දිගුකාලීන ණය එයින් .. | 22,276.8 | 29,172.1 | 34,597.3 | 46,025.0 | 53,680.9 | 973.6 | 1,219.6 | 1,471.1 | 1,758.4 | 2,083.9 |
| 1.1 යෝජනා ක්‍රම ණය .. | 6,784.3 | 9232.7 | 12,451.8 | 19,531.0 | 25,971.0 | 296.5 | 386.0 | 529.5 | 746.2 | 1,008.2 |
| 1.2 යෝජනා ක්‍රම නොවන ණය .. | 13,305.5 | 17,433.3 | 19,545.6 | 23,490.3 | 24,805.2 | 581.5 | 728.8 | 831.1 | 897.5 | 962.9 |
| 1.3 ජා.මූ.අ. භාරකාරත්ව අරමුදල් ණය .. | 2,187.0 | 2,506.1 | 2,599.9 | 3,003.7 | 2,904.7 | 95.6 | 104.8 | 110.5 | 114.7 | 112.8 |
| 2. සැපයුම් කරුවන්ගේ ණය .. | 837.4 | 1,114.6 | 996.6 | 889.4 | 588.6 | 36.6 | 46.6 | 42.4 | 34.0 | 22.8 |
| 3. ජා.මූ.අ. හැරගැනීම් .. | 2,334.8 | 5,319.3 | 5,088.7 | 4,870.3 | 5,050.0 | 112.6 | 241.9 | 217.8 | 196.0 | 191.8 |
| 4. බැංකු ණය ගැනීම් .. | 428.6 | 266.9 | 1,851.2 | 1,873.1 | 12.7 | 18.7 | 11.2 | 78.7 | 71.6 | 0.5 |
| 5. වෙනත් (ආ) .. | 4,123.9 | 6,469.2 | 10,766.9 | 14,294.2 | 14,988.3 | 180.2 | 270.5 | 457.8 | 546.1 | 581.8 |
| එකතුව | 30,001.5 | 42,342.1 | 53,300.7 | 67,952.0 | 74,320.5 | 1,321.7 | 1,789.8 | 2,267.8 | 2,606.1 | 2,880.8 |

(අ) තාවකාලික.

(ආ) රාජ්‍ය සංස්ථාවල හා එයාර් ලංකා සමාගමේ වෙළෙඳ ණය, ම. කො. ආ. කොමිසම යටතේ ඇති සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවලින් ගත් ණය වලින් සමන්විතය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 41 සංඛ්‍යා සටහන

## 1980—1984 ණය සේවා ගෙවීම

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1980 | 1981 (අ) | 1982 (අ) | 1983 (ආ) | 1984 (ආ) | 1980 | 1981 (අ) | 1982 (අ) | 1983 (අ) | 1984 (ආ) |
| 1. ණය සේවා ගෙවීම .. | 2,762·8 | 4,449·7 | 5,216·6 | 7,135·8 | 7,923·1 | 137·0 | 197·4 | 227·5 | 287·1 | 340·2 |
| 1·1 ණය ආපසු ගෙවීම .. | 1,781·5 | 2,084·1 | 2,563·3 | 3,120·7 | 3,345·3 | 91·4 | 93·8 | 112·0 | 126·5 | 128·7 |
| (i) ජා.මූ. අරමුදලට .. | 748·5 | 1,289·2 | 1,146·3 | 1,097·3 | 593·3 | 43·4 | 59·1 | 49·9 | 46·2 | 22·7 |
| (ii) අනෙකුත් (ඇ) .. | 1,033·0 | 794·9 | 1,417·0 | 2,023·4 | 2,752·0 | 48·0 | 34·7 | 62·1 | 80·3 | 106·0 |
| 1·2 පොළී ගෙවීම .. | 981·3 | 2,365·6 | 2,653·3 | 4,015·1 | 4,577·8 | 45·6 | 103·6 | 115·5 | 160·6 | 175·5 |
| (i) ජා.මූ. අරමුදලට .. | 345·6 | 487·6 | 519·5 | 749·3 | 819·2 | 12·4 | 21·7 | 22·4 | 30·8 | 31·4 |
| (ii) අනෙකුත් .. | 635·7 | 1,878·0 | 2,133·7 | 3,265·8 | 3,758·6 | 33·2 | 81·9 | 93·1 | 129·8 | 144·1 |
| 2. භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම .. | 22,207·8 | 26,526·1 | 28,059·8 | 33,071·6 | 46,062·2 | 1,032·0 | 1,168·1 | 1,221·7 | 1,312·9 | 1,769·3 |
| 3. භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලැබීම .. | 24,725·8 | 30,955·9 | 34,083·5 | 39,987·2 | 53,734·4 | 1,149·0 | 1,363·3 | 1,484·1 | 1,588·0 | 2,063·5 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) (2 හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 12·4 | 16·8 | 18·6 | 21·6 | 17·2 | 13·3 | 13·3 | 18·6 | 21·9 | 17·2 |
| (ii) ජා.මූ.අ. හි ගණුදෙනු හැර .. | 7·5 | 10·1 | 12·7 | 16·0 | 14·1 | 7·9 | 7·9 | 12·7 | 16·0 | 14·1 |
| 5. ණය සේවා අනුපාතිකය (ඇ) (3 හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 11·2 | 14·4 | 15·3 | 17·8 | 14·7 | 11·9 | 11·9 | 15·3 | 18·1 | 14·7 |
| (ii) ජා.මූ.අ. ගණුදෙනු හැර .. | 6·7 | 8·6 | 10·4 | 13·2 | 12·1 | 7·1 | 7·9 | 10·4 | 13·2 | 12·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.

(ආ) තාවකාලික.

(ඇ) තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම නිසා ම.කො.ආ. කොමිසමේ ව්‍යවසායයන්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් සමහරක් ණය ආපසු ගෙවීම සහ අනිකුත් අනුමත ව්‍යවසායයන්ට වි.ව්‍යා.මු.බැ. ඒකක වලින් නිකුත් කළ ණය මීට ඇතුළත් නොවේ.

(ඈ) වර්ෂය තුල විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

සියළුම අංශවලට අයත් දිගු කාලීන හා මධ්‍ය කාලීන මුළු ණය ප්‍රමාණය 1983 දී රුපියල් 5,689 කෝටි 20 ලක්ෂයේ (විගැහි 217 කෝටි 40 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 6,464 කෝටි 90 ලක්ෂය (විගැහි 251 කෝටිය) දක්වා වැඩි විය. මෙම ණය ප්‍රමාණය 1984 අවසානය වන විට නොගෙවා ඉතිරිව ඇති මුළු විදේශ ණය වලින් සියයට 87 ක් වූ අතර 1983 දී සියයට 83 ක් විය.

1984 වර්ෂයේ විදේශ ණය සංයුතියේ දක්නට ලැබුණ වැදගත් ලක්ෂණයක් වනුයේ කෙටි කාලීන හා අනිකුත් ණය යන අංශයේ ඇති වූ සැළකිය යුතු (සියයට 14 ක) අඩුවීමයි. මෙම අඩුවීම, ප්‍රධාන වශයෙන් දක්නට ලැබුනේ 1983 දී රුපියල් 187 කෝටි 30 ලක්ෂයේ (විගැහි හත්කෝටි 20 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් එක්කෝටි 30 ලක්ෂය (විගැහි පන්ලක්ෂය) දක්වා අඩු වූ, මහ බැංකුවේ කෙටි කාලීන ණය ගැනීම් අංශයේ ය. නොගෙවා ඉතිරිව ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හැර ගැණුම් ප්‍රමාණයද 1983 දී විගැහි 19 කෝටි 60 ලක්ෂයේ සිට විගැහි 19 කෝටි 20 ලක්ෂය දක්වා අඩු විය. නමුත් ප්‍රධාන වශයෙන් මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් හා අනිකුත් ව්‍යවසායයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් වැඩි වශයෙන් ණය ගැනීම නිසා ' අනිකුත් ණය ' වැඩි වී ඇත.

**ණය සේවා ගෙවීම්**

දිගුකාලීන සහ මධ්‍යකාලීන ණය ආපසු ගෙවීම් හා සියලුම විදේශ ණය වෙනුවෙන් වූ පොළී ගෙවීම් වලින් සමන්විත වන ණය සේවා ගෙවීම් 1983 දී රුපියල් 713 කෝටි 60 ලක්ෂයේ (විගැහි 28 කෝටි 70 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 792 කෝටි 30 ලක්ෂය (විගැහි 28 කෝටි 70 ලක්ෂයේ) සිට 1984 දී රුපියල් 792 කෝටි 30 ලක්ෂය (විගැහි 30 කෝටි 40 ලක්ෂය) දක්වා වැඩි විය. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යවසායයන් සහ අනිකුත් ආයතන ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය සඳහා ආපසු ගෙවීම් ඉහත සංඛ්‍යාවන්ට ඇතුළත්ව නැත. කෙසේ වෙතත් මෙම ණය සඳහා ගෙවන ලද පොළී මුදල් ඇතුළත් කොට ඇත. වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ගැනීම් සහ පොළී හා සේවා ගෙවීම් පිළිවෙලින් රුපියල් 59 කෝටි 30 ලක්ෂයක් (විගැහි දෙකෝටි 30 ලක්ෂයක්) සහ රුපියල් 81 කෝටි 90 ලක්ෂයක් (විගැහි තුන්කෝටි දශ ලක්ෂයක්) විය. පසුගිය වසරේ මේවාට සම සංඛ්‍යා පිළිවෙලින් රුපියල් 109 කෝටි 70 ලක්ෂයක් (විගැහි හාර කෝටි 60 ලක්ෂයක්) හා රුපියල් 74 කෝටි 90 ලක්ෂයක් (විගැහි තුන්කෝටි 10 ලක්ෂයක්) විය. ණය සේවා ගෙවීම්වල මුළු ප්‍රමාණය භාණ්ඩ අපනයනයෙන් සහ සේවාවන්ගෙන් ලත් මුළු ඉපයීම් වල ප්‍රතිශතයක් ලෙස ගත් කල විගැහි වටිනාකම අනුව 1983 දී සියයට 21.9 සිට 1984 දී සියයට 17.2 දක්වා පහත වැටිණ. අපනයන ඉපැයීම් ඉහළ යාම මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු අත්හල විට ණය සේවා අනුපාතය 1983 දී සියයට 16.0 සිට 1984 දී සියයට 14.1 දක්වා පහත වැටිණ. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම යනාදියෙන් වූ ලැබීම් වල ප්‍රතිශතයක් ලෙස, සමස්ත ණය සේවා ගෙවීම් 1983 හා 1984 වර්ෂ දෙක තුළදී සියයට 18.1 සිට සියයට 14.7 දක්වා අඩු විය.

## රාජ්‍ය මූල්‍ය කටයුතු*

1984 වසරේ දී රාජ්‍ය මූල්‍ය කටයුතු මඟින් අයවැය හිඟයෙහි සැළකිය යුතු අඩු වීමක් ඇතිවූවා මෙන්ම මීට ප්‍රථම බැංකු අංශයෙන් ලබාගත් ණයවලින් සැළකිය යුතු කොටසක් ආපසු ගෙවීමටද යෙදුණි. අයවැයට අදළ වර්තන ගිණුමේ අතිරික්තයක් ඇතිවූ අතර, එමගින් ප්‍රාග්ධන වියදම් සඳහා අවශ්‍ය සම්පත්වලින් කොටසක් සැපයින. එහෙයින් අයවැය කටයුතු සඳහා ලබාගත් ණය මුළුමනින්ම වාගේ ප්‍රාග්ධන වියදම මූල්‍යකරණය කිරීම සඳහා හිඟව පැවති සම්පත් ලබාගැනීමට සීමා විය.

* රජයේ ගිණුම් අවසාන වශයෙන් පිළියෙල කරන තෙක් තාවකාලික දත්තයන් මත පදනම් කර ඇත.